Sri Lanka
VETERINARY ASSOCIATION
"Working for the advancement of the veterinary profession since 1940"

25/04/2020

## කොවිඩ් 19 - වසංගතය පිළිබඳව සුරතල් සතුන් ඇති කරන අපි බිය විය යුතුද?

**සුරතල් සතුන් ඇති කරන බොහෝ දෙනෙකු මේ දිනවල නිතර නිතර අසන ප්‍රශ්න කිහිපයකට පිළිතුරු දීමට අපේක්ෂා කරමු.**

* කොවිඩ් - 19 කොරෝනා රෝගය බල්ලන් පූසන් වැනි සතුන් මගින් මිනිසාට වැළඳිය හැකිද?

නැත. මේ දක්වා කරන ලද කිසිදු පරීක්ෂණයකින් ඒ බව තහවුරු වී නැත.

* මෙම වසංගත රෝගය බල්ලන් පූසන් වැනි සුරතල් සතුන්ට වැළඳිය හැකිද?

ඉතාම කලාතුරකින් එලෙස වෛරසය බල්ලන් පූසන් කිහිප දෙනෙකුට ආසාදනය වී ඇති බවට සීමිත රටවල් කිහිපයක වාර්තා වී ඇත. එය නොසලකා හැරිය හැකි තරම්ය.

*සුරතල් සතෙකු කිසියම් ශ්වසන රෝග ලක්ෂණ පෙන්නුම් කරන්නේ නම් අපි බිය විය යුතුද?

ශ්වසන රෝග ඇති කරන වෙනත් රෝග කාරක ගණනාවක් වේ. එබැවින් ඒ පිළිබඳව පරීක්ෂා කිරීමට හා ප්‍රතිකාර ලබා ගැනීමට ඔබේ පශු වෛද්‍යවරයා හමුවන්න.

* අයාලේ යන සුනඛයන්ගෙන් මේ රෝගය පැතිරේ යැයි බිය විය යුතුද?

නැත. ලෝකයේ රටවල් කිහිපයක පමණක් ඉතා සුළු වාර්තා සංඛ්‍යාවක පළවන ආකාරයට කොවිඩ් - 19 රෝගයට ගොදුරු වූ පුද්ගලයින්ගේ නිවෙස් කිහිපයක පමණක් එම රෝගීන් සමග ඉතා ලගින් ඇසුරු කළ සුරතල් සතුන් කිහිප දෙනෙකුගේ ද සාම්පල පරීක්ෂා කිරීමේදී වෛරසය හදුනාගෙන ඇත. ඒ හැර අයාලේ යන සුනඛයන්ට රෝගය බෝවේ යැයි අනියත බියක් ඇති කරගත යුතු නැත.

*අපගේ සුරතල් සතුන් මේ රෝගය සදහා පරීක්ෂා කරගත යුතුද?

නැත. ඔබ කොවිඩ් - 19 රෝගියෙකු නම් හැර එලෙස කිසිදු අවශ්‍යතාවයක් මේ මොහොතේ නැත.

*අපේ සුරතල් සතුන් පශු වෛද්‍ය සායන හෝ රෝහල් වලින් පරීක්ෂා කරන්නේද?

නැත. මිනිසුන්ගේ රෝග පරීක්ෂාවන් පවා සිදුකරන්නේ ඒ සදහා විශේෂිත අවසරයක් හිමි විද්‍යාගාර වල පමණී. මේ මොහොතේ ඔබගේ සුරතල් සතුන් පරීක්ෂා කරදෙන මෙන් පශු වෛද්‍යවරුන්ගෙන් ඉල්ලා සිටීමෙන් වළකින්න. එය මේ මොහොතේ සිදුකිරීම ලෝකයේ කිසිදු රටක අනුමත කර නැත.

*මේ කාලය තුලදී සුරතල් සතුන් අප නිවෙස්වල තබා ගැනීම පිළිබඳ අප බිය විය යුතද?

නැත. ඔවුන්ට අහාර පාන හා අනෙකුත් අවශ්‍ය දෑ සුපුරුදු පරිදි ලබාදෙමින් ඔවුන්ව රැක බලා ගන්න.

*මේ මොහොතේ සුරතල් සතුන් සම්බන්ධව අප විසින් අනුගමනය කළයුතු විශේෂ පුරුදු මොනවාද?

මහජන සෞඛ්‍ය පිළිබද සෞඛ්‍ය බලධාරීන් ලබාදී ඇති උපදෙස් අනුගමනය කරන්න.මිනිසුන් අතර මෙම රෝගය වේගයෙන් ව්‍යාප්ත වන නිසා ඔබගේ සුරතල් සතුන් ආරක්ෂා කරගන්න. සුරතල් සතුන් ඇල්ලීමට ප්‍රථම හා පසුව අත් හොදින් සෝදන්න. එම සතුන් තුරුල් කරගැනීම, සිඹීම ආදියෙන් වළකින්න. ඔවුන්ට ප්‍රමාණවත් ආහාරපාන සුවපහසුව ලබාදෙන්න. එම සතුන් පිටස්තර පුද්ගලයන් වෙත නොයවන්න.